*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2024 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,379 - 2024 අප්‍රේල් මස 05 වැනි සිකුරාදා - 2024.04.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 124 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 130 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අප්‍රේල් මස 26 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අප්‍රේල් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

123 - B 082556 - 353 (2024/04)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ, පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. එම්. ශමීර නුවන් රත්නායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.08.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/479 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන සෙන්ට්ක්ලයිව් ඒ ජනපදයේ පදිංචි අතපත්තු ආරච්චිලාගේ ටිකිරි බණ්ඩා වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඒ 16/28 යටතේ 1984.01.17 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පස්බාගේ කෝරළයේ, රඹුක්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලේ රඹුක්පිටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ඇල් 9/24, 32 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ අංක පීපී මහ 520 දරන රේඛා සටහනේ අංක 47 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 පර්චස් 22 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම සෙන්ට්ක්ලයිව් ඒ

| | |
|---|---|
| *උතුරට* | : ටීපී 134062, |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 46, |
| *දකුණට* | : ජනපද පාර සහ කට්ටි අංක 50, |
| *බස්නාහිරට* | : කට්ටි අංක 48 සහ 49. |

ආර්. එම්. ශමීර නුවන් රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
පස්බාගේ කෝරළේ.

2023 සැප්තැම්බර් මස 07 වැනි දින.

04-28

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ, පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. එම්. ශමීර නුවන් රත්නායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.08.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/537 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන සෙන්ට්ක්ලයිව් ඒ ජනපදයේ පදිංචි අතාඋදගෙදර ඩිංගිරි අම්මා වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඒ 2/14 යටතේ 1987.09.18 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පස්බාගේ කෝරළයේ, රඹුක්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලේ රඹුක්පිටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක ඇල් 9/24, 32 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/ අංක පීපී මහ 520 දරන රේඛා සටහනේ අංක 149 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 පර්චස් 03 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම සෙන්ට්ක්ලයිව් ඒ

| | |
|---|---|
| *උතුරට* | : කට්ටි අංක 145 සහ 146, |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 150, |
| *දකුණට* | : ජනපද පාර, |
| *බස්නාහිරට* | : ජනපද පාර සහ කට්ටි අංක 148. |

ආර්. එම්. ශමීර නුවන් රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
පස්බාගේ කෝරළේ.

2023 සැප්තැම්බර් මස 07 වැනි දින.

04-29

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ, පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රාජපක්ෂගේ තිළිණ ප්‍රදීප් සුමනසේකර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1998.05.20 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/උනු/1012 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගෝනධිකාවත්ත හෙක්ටයාර් 25 ජනපදයේ පදිංචි මල්වැන්න හේවගේ රත්නපාල වෙත ප්‍රදානය කොට මහනුවර ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/C04/47/2003 යටතේ 2003.07.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳු පළාත කෝරළේ මාවීකුඹුර උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වටදෙණිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද මහනුවර මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක මහ/90/326 දරන පිඹුරේ රේඛා සටහනේ අංක 60 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.101 ක විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ රජයේ ඉඩම : ගෝනධිකාවත්ත හෙක්ටයාර් 25 ජනපදය

| | |
|---|---|
| *උතුරට* | : කට්ටි අංක 59 සහ කට්ටි අංක 53 1/2, |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 52 1/2 කොටසක් සහ පාර, |
| *දකුණට* | : පාර සහ කට්ටි අංක 82, |
| *බස්නාහිරට* | : කට්ටි අංක 83 කොටසක් සහ කට්ටි අංක 59. |

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
උඩුනුවර.

2023 අගෝස්තු මස 02 වැනි දින.

04-30

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ, පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත් සතර හා ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් උයන්වත්තේ ජයසිංහ මුදියන්සේලාගේ සම්පත් සුමන බණ්ඩාර ජයසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.09.27 වැනි දින ප්‍රදානය කර ඇති අංක මහ/ප්‍ර/630 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දඹවෙල ජනපදයේ වැඩිප්පුලි ආරච්චිගේ නෝමිස් අප්පුහාමි වෙත ප්‍රදානය කොට මහනුවර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LOD/G/40/427 යටතේ 1984.07.18 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ (පෙර පාතහේවාහැට) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගංදහය උතුර පත්තුවේ/කෝරළේ, ගුරුදෙණිය දඹවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගුරුදෙණිය නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 1 25/31.39 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි පී. පී. ඒ. 3075 දරන පිඹුරෙහි අංක 24 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 02 පර්චස් 09 ක් ඇතැයි ගණන් බලා තිබෙන දඹවෙල ජනපදය යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය

| | |
|---|---|
| *උතුරට* | : ලොට් අංක 16, |
| *නැගෙනහිර* | : ලොට් අංක 25, |
| *දකුණට* | : ලොට් අංක 39, |
| *බස්නාහිරට* | : ලොට් අංක 23. |

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර හා
ගඟවට කෝරළේ.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින.

04-31

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ, පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.11.28 වැනි දින ප්‍රදානය කර ඇති අංක මහ/කොත්/ඕර්/ප්‍ර/ගො/65 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අටබාගේ, නවදේවිට, ඕර්වෙල් හි පදිංචි ගැහින්තැන්නේ ගෙදර මාලනී වෙත ප්‍රදානය කොට ගම්පොළ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/C/05/137 යටතේ 1989.10.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර ඉහළ කෝරළේ, 304 - අංගම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහර (පළාත් ආණ්ඩු සභාවෙන් පිට කොටස) සහ දැල්පිටිය නමැති ගමේ පිහිටා ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත මු. පි. මහ 2256 දරන පිඹුරේ 9 (නවය) දරන බිම් කැබැල්ල, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.427 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : ඕර්වෙල්.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 08, |
| *නැගෙනහිරට* | : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ස්ටෝපීල්ඩ් වත්ත, |
| *දකුණට* | : කැබලි අංක 11, |
| *බස්නාහිරට* | : මාර්ගය. |

ආත්මා දිලුක්ෂි ජයරත්න,
නි. ඉ. කො. (අන්තර් පළාත්)/
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත - ගම්පොළ.

2023 ජූලි මස 26 වැනි දින.

04-32

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාතේ, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් (වැ.බ.) /හර්ෂ ශ්‍රී ක්‍රිෂ්මාල් ජයරත්න බණ්ඩාර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.05.12 වැනි දින ප්‍රදානය කර ඇති අංක පො/ප්‍ර/9234 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 663, යාය 12, ජයන්තිපුර ලිපිනයේ පදිංචි වේරගොඩ මාස ආරච්චි නෙවිල් රණසිංහ වෙත ප්‍රදානය කොට පොලොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2/5/72(11), යටතේ 1988.08.15 දින දී ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හෝ හිමිවී ඇති අයෙකු සිටිය ද, ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

#### උපලේඛනය

පොලොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුවේ/කෝරලේ 70 ජී ජයන්තිපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ජයන්තිපුර නමැති ගමෙහි පිහිටා ඇත්තා වූ සර්වේ ජනාරාල්වරයා විසින් සම්පාදිත අංක පී 17/50, 51, 52, 59 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ජ. පි. පො. 41 දරන කට්ටි කැඩීමේ පිඹුරේ/අංක 361 බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් අක්: 02, රූඩ් : 02, පර්:30 විශාලත්වය ඇත්තා වූ ද පහත දක්වා ඇති පරිදි මායිම් වූ ද රජයේ ඉඩම - මඩ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : ලොට් අංක 348, |
| *නැගෙනහිරට* | : ලොට් අංක 362, |
| *දකුණට* | : ලොට් අංක 379, |
| *බස්නාහිරට* | : ලොට් අංක 359. |

එච්. එස්. කේ. ජේ. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම් *(වැ.බ)*,
හිඟුරක්ගොඩ.

2023 නොවැම්බර් මස 22 වැනි දින.

04-33

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරු මැද පළාත් සභාවේ, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රාජපක්ෂ වාසල රණවාරණ මුදියන්සේලාගේ චතුරාණි රණවාරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.05.21 දින ප්‍රදානය කර ඇති අංක පො/ලං/ප්‍ර/1333 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන වන අංක 6 කණුව, හිඟුරක්දමන ලිපිනයේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ ලීලාවති යන අය වෙත ප්‍රදානය කොට පොලොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1/3/1/194 යටතේ 1996.09.04 දින දී ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. ඒ බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුවේ 146 හිඟුරක්දමන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හිඟුරක්දමන නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. පි. පො. 127 දරන පිඹුරේ අංක 90 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 00 රූඩ් 01 පර්චස් 39 විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 89, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 83 (අතුරු පාර) සහ 91, |
| *දකුණට* | : කැබලි අංක 91, 101, 102, |
| *බස්නාහිරට* | : කැබලි අංක 102 සහ 103. |

ආර්. ඩබ්. ආර්. එම්. සී. රණවාරණ,
ප්‍රාදේශීය ලේකම්,
ලංකාපුර.

2023 දෙසැම්බර් මස 20 වැනි දින.

04-34/1

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරු මැද පළාත් සභාවේ, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රාජපක්ෂ වාසල රණවාරණ මුදියන්සේලාගේ චතුරාණි රණවාරණ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.01.10 දින ප්‍රදානය කර ඇති අංක පො/ලං/ප්‍ර/1111 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන වන 6 කණුව, හිඟුරක්දමන ලිපිනයේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ ලීලාවති යන අය වෙත ප්‍රදානය කොට පොලොන්නරුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1/3/1/152 යටතේ 1996.07.23 දින දී ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. ඒ බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුවේ 146 හිඟුරක්දමන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හිඟුරක්දමන නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. පි. පො. 127 දරන පිඹුරේ අංක 26 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 05 පර්චස් 06 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 17, 24, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 24, |
| *දකුණට* | : කැබලි අංක 24, 16, |
| *බස්නාහිරට* | : කැබලි අංක 16, 17. |

ආර්. ඩබ්. ආර්. එම්. සී. රණවාරණ,
ප්‍රාදේශීය ලේකම්,
ලංකාපුර.

2023 දෙසැම්බර් මස 20 වැනි දින.

04-34/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් චතුර සමරසිංහ වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1993.04.07 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 33574 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන වන රාජාංග නය වම් ඉවුර යාය 04 පදිංචි හැට්ටුවන් පේඩ්ගේ පිලෝරිස් වෙත ප්‍රදානය කොට නිකවැරටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක නික/ගිරි/08/06 යටතේ 1993.09.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිබාව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, වන්නි හත්පත්තුවේ, මී ඔයෙන් එගොඩ කෝරළයේ, අංක 07 ජයන්තිපුර ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ, රාජාංගන වම් ඉවුර යාය 4 (සෝලේවැව) නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක එෆ් 12/16 හා එෆ් 12/24 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක ටෝපෝ. පි. පී. 18 දරන පිඹුරෙහි අංක 3886 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.807 ක් ඇතැයි ගණන් බලා තිබෙන කුඹුරු ඉඩම යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය:

| | |
|---|---|
| *උතුරට* | : බිම් කට්ටි අංක 3887, |
| *නැගෙනහිරට* | : බිම් කට්ටි අංක 3821, |
| *දකුණට* | : බිම් කට්ටි අංක 3993, |
| *බස්නාහිරට* | : බිම් කට්ටි අංක 3885. |

චතුර සමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ගිරිබාව.

2023 දෙසැම්බර් මස 18 වැනි දින.

04-35

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් දිසානායක මුදියන්සේලාගේ අනුර කුමාර දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අති ගරු ජනාධිපති විසින් 1983.08.09 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 05848 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන වන වැවගම, දියදොරවත්ත පදිංචි වීරසිංහ ගෙදර පෝල් ප්‍රනාන්දු වෙත ප්‍රදානය කොට කුලියාපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කුලි/කේ 01/203 යටතේ 1984 පෙබරවාරි 17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මයුරාවතී කෝරළේ, 1104 දියදොර ඉහලවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඉහලඉගුරුවත්ත නමැති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 10 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 929 දරන පිඹුරෙහි අංක 56 බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.202 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද දියදොරවත්ත නමැති රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : අ. ග. පි. 929 කැබලි අංක 51, |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 929 කැබලි අංක 57, |
| *දකුණට* | : අ. ග. පි. 929 කැබලි අංක 58, |
| *බස්නාහිරට* | : අ. ග. පි. 929 කැබලි අංක 55. |

ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුලියාපිටිය (බටහිර).

2023 අගෝස්තු මස 31 වැනි දින.

04-36

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාතේ, පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් දිසානායක මුදියන්සේලාගේ අනුර කුමාර දිසානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.08.28 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 10173 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දීගල්ල, ඉහල එලතලව පදිංචි මද්දුම මුදලිගේ ලුසිහාමි වෙත ප්‍රදානය කොට කුලියාපිටිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කුලි/කේ/6/119 යටතේ 1986 ජූලි මස 09 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු කටුගම්පල කෝරළයේ, 1174 - ඉහල එලතලව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඉහල එලතලව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 1 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි කුරුණෑගල මිනුම් අධිකාරී විසින් සම්පාදිත අංක 2188 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 189 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.250 ක් විශාලත්වය ඇත්තාවූද, මහලන්දේ මූකලාන නමැති පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : ප්‍රවේශ මාර්ගය, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 188, |
| *දකුණට* | : කැබලි අංක 191, |
| *බස්නාහිරට* | : කැබලි අංක 190. |

ඩී. එම්. ඒ. කේ. දිසානායක,
ප්‍රාදේශීය ලේකම් ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුලියාපිටිය (බටහිර).

2023 අගෝස්තු මස 28 වැනි දින.

04-37

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් පී. එම්. එස්. ප්‍රියංගනී පතිරාජ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.12.08 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 52348 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන වේරහැරයාගම, මීනුවන්ගැටේ පදිංචි සිංහලගේ කීර්තිසේන වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක D5183/98 යටතේ 1998.09.22 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

#### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දේවමැද්දේ කෝරළේ 1254 - වල්පාලුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වේරහැරයාගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක අ. ග. පි. 2487 දරන කට්ටි කැඩීමේ පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර 02, ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම:

| | |
|---|---|
| *උතුරට* | : අතුරු පාර (වල්පාලුව ගම මැද පාර), |
| *නැගෙනහිරට* | : ප්‍රධාන පාර, |
| *දකුණට* | : අතුරු පාර, |
| *බස්නාහිරට* | : ජයවීරගේ ඉඩම. |

පී. එම්. එස්. ප්‍රියංගනී පතිරාජ,
ප්‍රාදේශීය ලේකම් ,
වාරියපොල.

2023 නොවැම්බර් මස 08 වැනි දින.

04-38

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්ලිව්. ඒ. එස්. එම්. විතානආරච්චි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983.03.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක 03818 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අස්සැද්දුම, රුද්‍රිගුවත්ත පදිංචි රංහොට් පේඩිගේ චාර්ලිස් වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක A7/928/85 යටතේ 1985.07.11 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.04.26** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු වේ.

**උපලේඛනය**

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැඩවිල්ලි හත්පත්තුවේ, කුඩා ගල්බඩ කෝරළේ 217, උඩදිගන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙමටගහපැලැස්ස නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 1113 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 35 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.113 ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : රුද්‍රිගුවත්ත.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 24, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 34, |
| *දකුණට* | : කැබලි අංක 24, |
| *බස්නාහිරට* | : කැබලි අංක 24. |

ඩබ්ලිව්. ඒ. එස් එම්. විතානආරච්චි,
ප්‍රාදේශීය ලේකම් ,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
මාස්පොත.

2023 දෙසැම්බර් මස 07 වැනි දින.

04-39

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/32807.
*සහකාර ඉඩම් කොමසාරිස්ගේ අංකය* : KN/LTL/982

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පේරාරු ග්‍රාම නිලධාරි වසමේ, පේරාරු ගමේ, ජනපද නිලධාරි දළ අනුරේඛනයෙහි කැබලි අංක බී ප්‍රමාණයෙන් රූඩ් 03 පර්චස් 8.5 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා නාගප්පන් අරුලම්පලම් මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 1140 2/2, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 1143, |
| *දකුණට* | : | කැබලි අංක 972, |
| *බටහිරට* | : | කැබලි අංක 1144 1/2 ඉතිරිය |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට 2025.06.14 දක්වා)

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50% කට නොඅඩු විය යුතුය.

*දඩ මුදල* : ඉඩමේ දියුණු වටිනාකමින් 4% මෙන් තුන් ගුණයකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 1995.06.15 දින සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 මාර්තු මස 04 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-58

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/32809.
*සහකාර ඉඩම් කොමසාරිස්ගේ අංකය* : KN/LTL/959

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කන්තලේ නගරය ග්‍රාම නිලධාරි වසමේ, කන්තලේ ගමේ, ජනපද නිලධාරි අනුරේඛනයෙහි කැබලි අංක ඒ දරන ප්‍රමාණයෙන් පර්චස් 5.5 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ඩැනියල් ආරච්චිගේ විමලසිරි මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

කැබලි අංක ඒ හි මායිම් -

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 3239 දරන ඉඩම කැබලි අංක 3240 දරන පාර, |
| *නැගෙනහිරට* | : | අග්‍රබෝධි මාවත, |
| *දකුණට* | : | කැබලි අංක 6903 දරන ඉඩම, |
| *බටහිරට* | : | කැබලි අංක 6902 දරන ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට 2025.06.14 දක්වා)

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ වාණිජ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50% කට නොඅඩු විය යුතුය.

*දඩ මුදල* : ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටෙක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 1995.06.15 දින සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 මාර්තු මස 04 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-59

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|

### 2024 වර්ෂය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් | 2024.04.05 | සිකුරාදා | 2024.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.10 | බදාදා | 2024.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.04.19 | සිකුරාදා | 2024.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.26 | සිකුරාදා | 2024.04.10 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2024.05.03 | සිකුරාදා | 2024.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.10 | සිකුරාදා | 2024.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.17 | සිකුරාදා | 2024.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.22 | බදාදා | 2024.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.31 | සිකුරාදා | 2024.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2024.06.07 | සිකුරාදා | 2024.05.22 | බදාදා | දහවල් | 12.00 |
| | 2024.06.14 | සිකුරාදා | 2024.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.20 | බ්‍රහස්පතින්දා | 2024.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.28 | සිකුරාදා | 2024.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.